# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/30 - 2018 නොවැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2019 ජනවාරි 01 දිනයෙන් පසු බලාත්මක කරන ගිණුම්කරණ ප්‍රමිතවලට ශ්‍රී.ල.ගි.ප්‍ර. (LKAS 19) සැලසුම් සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීම (SLFRSs) සංශෝධන (LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන සහ LKAS 12 ආදායම් බදුවලට සංශෝධන) මේ සමග පළකර ආයතනය විසින් සම්මත කර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහනවයේ ජනවාරි 01 දින හෝ ඊටපසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශ සඳහා බලාත්මක කළයුතුයි.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

ප්‍රසන්න ලියනගේ,
ලේකම්.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# සැලසුම් සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීම

# (LKAS 19 ට සංශෝධන)

# LKAS 19 ට සංශෝධන *සේවක ප්‍රතිලාභ*

101අ, 122අ, 123අ හා 179 යන ඡේද අලුතින් එකතුකර ඇති අතර 57, 99, 120, 123, 125, 126, හා 156 යන ඡේද සංශෝධනය කර ඇත. 122අ ඡේදයට කලින් මාතෘකාවක් එකතු කර ඇත. අලුතින් එකතුකර ඇති පාඨ යටින් ඉරි ඇඳ ඇති අතර ඉවත් කරන ලද ඡේද කපා ඉවත් කර ඇත.

## පශ්චාත් සේවා ප්‍රතිලාභ: නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

......

## හඳුනාගැනීම සහ මැනීම

......

57. අස්තිත්ත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණයේදී පහත සඳහන් පියවර සම්බන්ධ කර ගැනේ.

......

(ඇ) ලාභය හෝ අලාභයෙහි හඳුනාගතයුතු වටිනාකම් නිර්වචනය කිරීම:

(i) ප්‍රවර්තන සේවා පිරිවැය (70-74 ඡේද හා 122අ ඡේදය බලන්න)

......

......

## නිරවුල් කිරීම මත අතීත සේවා පිරිවැය සහ ප්‍රතිලාභ සහ අලාභ

**99. අතීත සේවා පිරිවැය හෝ නිරවුල් කිරීම මත පැනනඟින ප්‍රතිලාභ හෝ අලාභ නිර්ණය ~~කිරීමට පළමුවමේදී~~ : අස්තිත්ත්වයක් විසින් සැලසුම් වත්කම්වල ප්‍රවර්තන සාධාරණ වටිනාකම සහ ප්‍රවර්තන ආයුගණක උපකල්පන (ප්‍රවර්තන වෙළඳපොල පොලී අනුපාතික සහ වෙනත් ප්‍රවර්තන වෙළඳ මිල ඇතුලත්ව) පිළිබිඹුවන පරිදි:**

**(අ) සැලැස්ම සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීමට පළමු සැලැස්ම සහ සැලැසුම් වත්කම් යටතේ පිරිනමන ප්‍රතිලාභ සහ**

**(ආ) සැලැසුම් සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීමට පසුව සැලැස්ම සහ සැලැසුම් වත්කම් යටතේ පිරිනමන ප්‍රතිලාභ භාවිතා කරමින් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කළ යුතුය.**

........

101අ සැලැස්මක් සංශෝධනය කිරීම, කපාහැරීම හෝ නිරවුල් කිරීම සිදුවනවිට පැනනඟින අතීත සේවා පිරිවැයක් හෝ නිරවුල් කිරීමට අදාල ලාභයක් හෝ අලාභයක් වෙතොත්, අස්තිත්ත්වයක් විසින්, 99-101 හා 102-112 ඡේද අනුව හඳුනාගැනීම හෝ මැනීම සිදුකල යුතුය. එසේ සිදුකරනු ලබන විට, අස්තිත්ත්වයක් විසින් වත්කම් සීමාවට සිදුවන බලපෑම සැලකිල්ලට නොගත යුතුය. වත්කම් සීමාවට සිදුවන බලපෑම අස්තිත්ත්වයක් විසින් සැලැසුම් සංශෝධනය කිරීම, කපාහැරීම, හෝ නිරවුල් කිරීමෙන් පසුව නිර්ණය කලයුතු අතර එමනිසා සිදුවන කිසියම් වෙනස්වීමක් වෙතොත් 57 (ඇ) ඡේදය අනුව හඳුනාගත යුතුය.

........

## නිර්වචික ප්‍රතිලාභ පිරිවැයෙහි සංරචක

120 වෙනත් **SLFRS** එකකින් ඒවායේ ඇතුලත් කිරීම අවශ්‍යකරන හෝ අවසර දෙන ප්‍රමාණයට හැර, අස්තිත්ත්වයක් විසින් නිර්වචික ප්‍රතිලාභ පිරිවැය සංරචකයන් පහත සඳහන් පරිදි හඳුනාගත යුතුය.

(අ) සේවා පිරිවැය (66-112අ ඡේද සහ 122අ ඡේද බලන්න) ලාභය හෝ අලාභයෙහි;

......

## ප්‍රවර්තන සේවා පිරිවැය

122අ වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී නිර්ණය කරන ලද ආයුගණක උපකල්පන භාවිතා කරමින් යම් අස්තිත්ත්වයක් විසින් වර්තමාන සේවා පිරිවැය නිර්ණය කල යුතු ය. කෙසේ වෙතත් 99 වැනි ඡේදය අනුව යම් අස්තිත්ත්වයක් ශුද්ධ නිර්විත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කරන්නේනම්, සැලසුම සංශෝධනය, කපාහැරීම හෝ නිරවුල් කිරීමෙන් පසුව වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ඉතිරි ප්‍රමාණයට අදාල ප්‍රවර්තන සේවා පිරිවැය මිණුම් කල යුත්තේ 99(ආ) ඡේදය අනුව, ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කිරීමට භාවිතාකල ආයුගණක උපකල්පන භාවිතා කිරීම මඟිනි.

## ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය

123 යම් අස්තිත්ත්වයක් විසින් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) මත ශුද්ධ පොළිය නිර්ණය කළ යුත්තේ ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) 83 වැනි ඡේදයෙහි නිශ්චය කර ඇති වට්ටම් අනුපාතයෙන් වැඩි කිරීම මගිනි. ~~එසේ කිරීමේදී එම කරුණු දෙකම දායකත්ව සහ ප්‍රතිලාභ ගෙවීම්වල ප්‍රතිඵලය ලෙස ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම් (වත්කම්)වල කාලපරිච්ඡේදය තුළ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී නිර්ණය කළ ආකාරයටය.~~

123අ 123 වැනි ඡේදය අනුව ශුද්ධ පොළිය නිර්ණය කිරීමේ දී යම් අස්තිත්ත්වයක් විසින් වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී නිර්ණය කරන ලද ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) සහ වට්ටම් අනුපාතය යොදාගත යුතුය. කෙසේ වෙතත්, 99 වැනි ඡේදය අනුව යම් අස්තිත්ත්වයක් විසින් ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කරන්නේ නම්, සැලසුම සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීමෙන් පසුව වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ඉතිරි ප්‍රමාණයට අදාල ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කළ යුත්තේ:

(අ) 99 (ආ) ඡේදය අනුව නිර්ණය කරන ලද ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) සහ

(ආ) 99 (ආ) ඡේදය අනුව ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කිරීම සඳහා යොදාගත් වට්ටම් අනුපාතය භාවිතා කිරීම මඟිනි.

යම් අස්තිත්ත්වයක් විසින් 123අ ඡේදය භාවිතා කිරීමේදී, දායකත්ව සහ ප්‍රතිලාභ ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම්) වල කාලපරිච්ඡේදය තුළ වෙනස්වීම් සැලකිල්ලට ගත යුතුය.

......

125 සැලසුමේ වත්කම් මත පොළිය, සැලසුමේ වත්කම් ඵලදාව මත සංරචකයන් සහ එය නිර්ණය කරනුයේ 123 (අ) ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්මේ අනුපාතය මගින් සැලැස්මේ වත්කම් වල සාධාරණ අගය ~~වැඩි කිරීමෙන් වන අතර~~ වැඩි කිරීම මගිනි. අස්තිත්ත්වයක් විසින් සැලසුමේ වත්කම් වල සාධාරණ අගය වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී නිර්ණය කළ යුතුය. ~~කාල පරිච්ඡේදය තුල දායක මුදල් ලැබීම් සහ ප්‍රතිලාභ ගෙවීම් වල ප්‍රතිඵලයක් ලෙස සැලසුමේ වත්කම් වල යම් වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් නිර්ණය කරයි.~~ කෙසේ වෙතත්, 99 වැනි ඡේදය අනුව යම් අස්තිත්ත්වයක් විසින් ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කරන්නේ නම්, සැලසුම සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීමෙන් පසුව වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ඉතිරි ප්‍රමාණයට අදාල පොළී ආදායම නිර්ණය කළ යුත්තේ 99 (ආ) ඡේදය අනුව ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වත්කම (වගකීම) නැවත මිණුම් කිරීම සඳහා යොදා ගත් සැලැස්මේ වත්කම් භාවිතා කරමින් ය. යම් අස්තිත්ත්වයක් විසින්, 123අ ඡේදය භාවිතා කිරීමේදී දායකත්ව සහ ප්‍රතිලාභ

ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම් (වත්කම්) වල කාලපරිච්ඡේදය තුළ වෙනස්වීම් සැලකිල්ලට ගත යුතු ය. සැලැස්මේ වත්කම් මත පොළිය සහ සැලැස්මේ වත්කම් මත ඵලදාව අතර වෙනස ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කිරිමෙහි ඇතුලත් කරනු ලබයි.

126 පොළිය වත්කම් සීමාව මත බලපෑම, වත්කම් සීමාවේ මුළු වෙනසේ කොටසක් වන අතර එය 123අ වන ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්ටම් අනුපාතය මගින් වත්කම් සීමාවේ බලපෑම වැඩිකිරීම මගින් නිර්ණය කරනු ලබයි. අස්තිත්ත්වයක් විසින් වත්කම් සීමාවක මත බලපෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී නිර්ණය කළ යුතුය. කෙසේ වෙතත්, 99 වැනි ඡේදය අනුව යම් අස්තිත්ත්වයක් විසින් ශුද්ධ නිර්වචික වගකීම (වත්කම්) නිර්ණය කරනු ලබන්නේ නම්; සැලසුම සංශෝධනය කිරීම, කපා හැරීම හෝ නිරවුල් කිරීමෙන් පසු වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ ඉතිරි ප්‍රමාණයට අදාල වත්කම් සීමාව මත පොළිය නිර්ණය කල යුත්තේ 101අ ඡේදය අනුව නිර්ණය කරන ලද වත්කම් සීමාව මත බලපෑමේ කිසියම් වෙනසක් වේ නම් එයද සැලකිල්ලට ගැනීම මගින් ය. එම ~~මුදලේ~~ වත්කම් සීමාවේ වෙනස මත පොළිය සහ වත්කම් සීමාවේ බලපෑමෙහි මුළු සංචලනය අතර වෙනස ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කිරීමෙහි ඇතුළත් කරයි.

.........

## වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ

........

### හඳුනාගැනීම සහ මිණුම් කිරීම්

.......

**156 වෙනත් SLFRS මගින් ඒවා වත්කමෙහි පිරිවැයෙහි ඇතුලත් කිරීම අවශ්‍යකරන හෝ අවසරදෙන ප්‍රමාණයට හැර වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ සඳහා අස්තිත්ත්වයක් විසින් ලාභ, ලාභ ගිණුමේ පහත සඳහන් අයිතමයන්ගේ ශුද්ධ එකතුව හඳුනා ගත යුතුය.**

**(අ) සේවා පිරිවැය (66-112 ඡේද හා 122අ ඡේදය බලන්න)**

.......

## සංක්‍රාන්තිය සහ බලාත්මක දිනය

.......

179 2018 පෙබරවාරි මාසයේ දී නිකුත් කළ සැලසුම් සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීම (LKAS 19 ට සංශෝධන) 101අ 122අ සහ 123අ ඡේද අළුතින් එකතු කර ඇති අතර 57, 99, 120, 123, 125, 126 සහ 156 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් විසින් මෙම සංශෝධන, 2019 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන පළමු වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වන සැලසුම් සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීම් සඳහා භාවිතා කළ යුතුය. කලින් ව්‍යවහාර කරණයට ද අවසර දේ, කලින් ව්‍යවහාර කරනු ලබන්නේ නම් ඒ බව හෙළිදරව් කළ යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.